රටක මහිම - 4

# ඉසුරුමුණි රජ මහ වෙහෙර

ප්‍රථම මුද්‍රණය : 2016

කර්තෘ : © ජේ. බී. දිසානායක
ඡායාරූප : © පණ්ඩුක ද සිල්වා
සියලු හිමිකම් ඇවිරිණි

**ISBN 978-955-696-177-5**

ප්‍රකාශනය:

(C) Sumitha Publishers

සුමිත ප්‍රකාශකයෝ
E-mail: info@sumithabooks.com
www.sumithabooks.com
දුරකථනය : 0777809676

පරිගණක සැලැස්ම හා මුද්‍රණය:

SRIDEVI

YS%foaùms%kag¾ia^m%hsfjÜ&sñgâ
27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.
දුරකථනය : 2716709



# පටුන


| | | |
|---|---|---|
| 1. | අනුරාධපුරේ | 5 |
| 2. | ඉසුරුමුණි රාජ මහා විහාරය | 6 |
| 3. | මේ පුරාණ ‘මේඝ ගිරි විහාරය’ ද? | 8 |
| 4. | ඉසුරුමුණිය කළේ කවුද? | 10 |
| 5. | පරණ ලෙන් විහාර ගේ | 12 |
| 6. | අලුත් විහාර ගේ | 16 |
| 7. | බෝධීන් වහන්සේ | 20 |
| 8. | වෙහෙර වහන්සේ | 22 |
| 9. | සිරි පා සටහන් | 24 |
| 10. | සඳකඩපහණ | 33 |
| 11. | මුරගල | 36 |
| 12. | කොරවග්ගල | 40 |
| 13. | ගණ රූප කැටයම් | 42 |
| 14. | මිනිසා හා අශ්වයා | 44 |
| 15. | පොකුණේ දිය කෙළින ඇත්තු | 50 |
| 16. | ඉසුරුමුණි පෙම් යුවළ | 51 |
| 17. | ඉසුරුමුණි රජ පවුල | 58 |
| 18. | කවාට කැටයම් | 61 |
| 19. | රන්මසු උයන | 64 |
| 20. | විශ්වයේ සිතියමක්? | 68 |
| 21. | ඉසුරුමුණිය කළ දෙවනපෑතිස් රජ්ජුරුවෝ | 70 |
| 22. | ඉසුරුමුණිය බැබළවූ රජවරු | 72 |
| 23. | තිසා වැව | 74 |
| 24. | වෙස්සගිරිය | 76 |
| 25. | ඉසුරුමුණි සඟ පරපුර | 82 |


(C) Sumitha Publishers

# 1.
# අනුරාධපුරේ

'අනුරාධපුරය' 'අනුරාධපුරේ' නැත්නම් 'අනුරපුර' අපේ රටේ මුල් ම අගනුවර. ඒක අගනුවර වෙන්ට කලින් පැවතුණේ ගමක් හැටියට. ඒකට එදා කීවෙ 'අනුරාධගම' කියලා. 'මහාවංස' කියන පාලි වංස කථාවේ මේ නම තියෙන්නෙ 'අනුරාධගාම' කියලා.

ක්‍රිස්තු වර්ෂයෙන් පළමුවෙනි සියවසේ දී විතර අපේ රටේ මුල් ම සිතියම ඇඳපු ටොලමි (Ptolemy) නම් ග්‍රීක ජාතිකයා මේ නම ලියලා තියෙන්නේ 'Anurogrammi' කියලා. ඒ කාලෙ අපේ රට හඳුන්වලා තියෙන්නේ 'ටැප්‍රොබානා'(Taprobana) යන නමින්.

අනුරාධපුරේ අගනුවරක් බවට පත් කළේ පණ්ඩුකාභය රජතුමා. ඒ ක්‍රිස්තු වර්ෂයෙ උදාවට අවුරුදු හාරසීයකට විතර උඩ දී. එදා සිට දහවෙනි සියවසේ අවසානය දක්වා ම එය සිංහල රාජධානියේ අගනුවර හැටියට පැවතුණා. ඊට පස්සෙ පොළොන්නරුව අගනුවර බවට පත් වුණා.

අද අනුරාධපුර නගරයෙ කොටස් දෙකක් තියෙනවා. එකක් 'පූජා නගරය'. අනික 'නව නගරය'. වෙහෙර විහාර වගේ වන්දනා කරන තැන් ඔක්කොම පිහිටා තියෙන්නේ පූජා නගරෙ. අටමස්ථානෙත් ඉසුරුමුණියත් පිහිටා තියෙන්නේ මේ පූජා නගරෙ.

ඉසුරුමුණියට යන්නේ අනුරාධපුර කුරුණෑගල් පාරෙ. එය පිහිටා තියෙන්නේ අනුරාධපුරේ දකුණු සීමාවෙ තිසා වැව් බැම්මට පහළින්. ඒ ළඟ ම තමා 'රන් මසු උයන' කියන මඟුල් උයනත් 'වෙස්සගිරිය' කියන පුරාණ තපෝ වනයත් පිහිටා තියෙන්නෙ. ඉස්සර කාලෙ දි වෙස්සගිරියත් අයිති වුණේ ඉසුරුමුණියට ම යි.

'අටමස්ථානෙට' ඇතුළත් වන විහාරාරාම මොනවද කියන එක කලින් කලට වෙනස් වෙලා තියෙනවා. අද 'අටමස්ථානෙ' හැටියට සැලකෙන්නේ මෙන්න මේ ස්ථාන අට යි:

1 ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ
2 රුවන්වැලි මහ සෑය
3 ථූපාරාමෙ
4 අභයගිරිය
5 ජේතවනය
6 මිරිසවැටිය
7 ලංකාරාමෙ
8 ලෝවාමහපාය

ඉසුරුමුණිය මේ ස්ථාන අටට ඇතුළත් වෙන්නෙ නෑ. ඒ කලින් ගත්තු යම් [illegible] හේතු නිසා. ඒකට එක් හේතුවක් වෙන්ට ඇත්තේ ඉසුරුමුණිය පසු කාලෙක දි මහාවිහාරයෙ ථේරවාද පරම්පරාවෙන් ඈත් වෙලා මහායාන පරම්පරාවට සම්බන්ධ වීම නිසා විය හැකියි.

පුරාණ ලෙන් විහාරය ළඟ ගලේ කෙළා තියෙන මිනිස් රූපය 'අවලෝකිතේශ්වර' නම් බෝධිසත්වයන්ගේ රූපය බවත් ඒ ළඟ ම ඇති අශ්ව රූපය එතුමාගෙ 'හයග්‍රීව' නම් අශ්වයාගෙ රූපය බවත් සමහරු පෙන්වා දෙනවා. මේ බෝධිසත්වයො මහායාන බෞද්ධයන්ගේ වැඳුම් පිදුම් ලබන දෙවි කෙනෙක්.

කොහොම වුණත් අනුරාධපුරේ වැඳ පුදා ගන්ට එන වන්දනාකරුවා ඉසුරුමුණි රජ මහ වෙහෙරත් වැඳ පුදා ගෙන තමයි වන්දනා ගමන අවසන් කරන්නෙ. මේ පොත ඉසුරුමුණි රජ මහ වෙහෙර ගැන.

(C) Sumitha Publishers

# 2.
# ඉසුරුමුණි රාජ මහා විහාරය

මේ විහාරයට අද කියන්නේ 'ඉසුරුමුණි රාජ මහා විහාරය' 'ඉසුරුමුණි රජ මහ වෙහෙර' නැත්නම් 'ඉසුරුමුණිය' කියලා. 'මහාවංස' නම් පාලි වංස කථාවේ මේ නම ලියා තිබුණේ 'ඉස්සරසමණක' හා 'ඉස්සරසමණ' කියලා.

'ඉස්සරසමණාරාම' 'ඉස්සරසමණවිහාර'යන නම්වලින් ද මේ විහාරෙ හඳුන්වලා තියෙනවා. පළමුවෙනි සියවසට අයත් සෙල් ලිපිවල මේ නම ලියා තියෙන්නේ 'ඉසිරමණ' කියලා. 'සමන්තපාසාදිකා' නම් පාලි අටුවාවේ මේ නම ලියා තියෙන්නේ 'ඉස්සරනිම්මාන' කියලා.

(C) Sumitha Publishers

මේ විහාරෙට 'කසුන්ගිරි වෙහෙර' කියලත් කියා තියෙනවා. ඒ නම සඳහන් වෙන්නේ 'මහාබෝධිවංශ ග්‍රන්ථිපද විවරණය' නම් පොතේ බව පූජ්‍ය වැලිවිටියේ පණ්ඩිත සෝරත හාමුදුරුවො උන් වහන්සේගෙ 'ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ' 252 පිටුවෙ සඳහන් කරනවා.

පසු කාලෙක දි ඉසුරුමුණියට 'කස්සපගිරි' 'කසුබ්ගිරි' යන නමුත් යෙදී තියෙනවා. 'කස්සප' කියන පාලි පදයෙනුත් 'කාශ්‍යප' කියන සංස්කෘත පදයෙනුත් අදහස් කෙරෙන්නේ කාශ්‍යප රජතුමා. හතරවෙනි මහින්ද රජතුමා වෙස්සගිරියෙ පිහිටවපු සෙල් ලිපියෙ සඳහන් වෙනවා 'ඉසුරමෙණු බො උපුල්වන් කසුබ්ගිරි රද් මහ විහාර' යන නම.

මේ විහාරෙට 'කසුබ්' යන නම ලැබුණෙ පළමුවෙනි කාශ්‍යප රජතුමා එතෙන්ට සම්බන්ධ වුණු හන්දා. මහාවංසෙ 38 වෙනි පරිච්ඡේදෙ කියා තියෙන විදියට එතුමා මේ විහාරෙ හොඳට ප්‍රතිසංස්කරණය කළා. අලුත් කොටස් එකතු කළා. ආදායම් ලබා ගන්ට ගොදුරුගම් පැවරුවා.

රජතුමාට හිටියා 'බෝධි' යි 'උප්පලවණ්ණා' යි කියලා දෝණියන්දෑවරු දෙන්නෙක්. රජතුමා ඒ දූවරුන්ගේ නම් දෙකයි තමාගෙ නමයි එක් කරලා මේ විහාරෙට 'ඉසුරුමෙණු බො උපුල්වන් කසුබ් ගිරි රද් මහ වෙහෙර' යන නම දුන්නා.

මේ විහාරෙ මහාවිහාරෙ ථේරවාද භික්ෂූන් වහන්සේලාට පිළිගන්වන්ට ගිය වෙලාවෙ ගැටලුවක් මතු වුණා. කාශ්‍යප රජතුමා ප්‍රසිද්ධ වෙලා හිටියෙ පියා මරපු පුතෙක් හැටියට නෙ. 'පිතෘඝාතකයෙක්' හැටියට නෙ. එහෙම කෙනෙකුගෙන් විහාරයක් පිළිගත්තොත් 'මේක පිතෘඝාතකයෙකුගෙ වැඩක්' කියලා ලෝවැස්සො දොස් කියන්ට පුළුවන්. ඒ නිසා විහාරෙ පිළිගන්ට මහාවිහාරෙ හාමුදුරුවරු අදිමදි කළා.

නමුත් රජතුමාටත් ඕනැ වුණේ තමා අලුත්වැඩියා කරපු විහාරෙ කොහොමහරි මහාවිහාරෙට ම පූජා කරන්ට යි. 'මහාවිහාරෙ' කියන්නේ ථේරවාද භික්ෂු පරම්පරාවෙ මූලස්ථානෙ. රජතුමා කොහොම ද ඒ ගැටලුව විසඳා ගත්තෙ? රජතුමාට හොඳ නුවණක් පහළ වුණා.

රජතුමා මහාවිහාරෙ හාමුදුරුවරුන්ට කීවා "එහෙම නං මං මේ විහාරෙ එහි වැඩ ඉන්න බුදු පිළිම වහන්සේට පූජා කරන්නං" කියලා. එතකොට හාමුදුරුවරු ඒක පිළිගත්තා 'මේක අපේ ශාස්තෲන් වහන්සේගෙ භෝගය නෙ' කියලා.

මේ කතාව 'මහාවංසයෙහි' 41 වෙනි පරිච්ඡේදයෙ 10 ගාථාවේ සිට ගාථා හතරකින් දක්වා තියෙනවා. මේ ගාථා හතර 72-73 පිටුවල දැක්වෙනවා.


(C) Sumitha Publishers

# 3.
# මේ පුරාණ 'මේඝ ගිරි විහාරය' ද ?

අරිට්ඨ කුමාරයා ඇතුළු සිටුවරුන් පන්සීයක් පැවිදි වුණේ මිහිඳු හාමුදුරුවන් ළඟට ඇවිත් බව මහාවංසෙ සඳහන් වෙනවා. එහෙම නම් ඒ වෙලාවෙ මිහිඳු හාමුදුරුවන් වැඩ ඉඳලා තියෙන්නේ අද ඉසුරුමුණි විහාරෙ පිහිටලා තියෙන තැන.

එයින් වැදගත් කාරණයක් හෙළි වෙනවා. එනම් ඊට කලිනුත් එතන ලොකු විහාරයක් තිබුණු බව යි. එහෙම නම් ඒ විහාරයට කලින් කීව නම මොකද්ද?

'දළදා සිරිත' නම් පොතේ මේ පුරාණ විහාරෙ හඳුන්වලා තියෙන්නේ 'මේඝ ගිරි' 'මෙඝ ගිරි' 'මෙත් ගිරි' යන නම්වලින්. පාලි භාෂාවෙන් 'මේඝ' කියන්නේ 'වැහි වලාකුළට'. සිංහල භාෂාවෙන් වැහි වලාකුළට කියන්නේ 'මෙය්' නැත්නම් 'මේ' කියලා. අපට වැස්ස ලබා දෙන්නේ වැහි වලාකුළු යි.

මෙතෙන්ට ඇයි 'වැහි වලාකුළු විහාරෙ' වගේ නමක් දෙන්ට ඇත්තෙ? වැස්ස වස්සා ගන්ට යම් යම් පුද පූජා මෙතන කෙරුණු හන්දා වෙන්ට ඕනැ. මහාචාර්ය පරණවිතාන හිතන්නේ පුරාණ ලෙන් විහාරෙ ළඟ ගලේ නෙළා තියෙන මිනිස් රූපෙ 'පර්ජන්‍ය' නැත්නම් 'පැදුම්' කියන දෙවියන්ගේ රූපෙ බව යි. මේ දෙවියො තමා වැස්සට අධිපති දෙවියො.

දළදා වහන්සේ අනුරාධපුරේට වැඩම කරපු අවස්ථාවෙදි මුලින් ම තැන්පත් කළෙත් මේ විහාරෙ. දළදා වහන්සේටත් වැස්ස වස්සන්ට පුළුවන් බව බෞද්ධයො දන්නවා. අද වුණත් මහනුවර දළදා පෙරහැර පවත්වන්නේ වැස්ස වස්සන්ට නෙ.

වැස්ස නිසා හුඟක් සතුටු වෙන්නෙ අලි ඇත්තු. පර්ජන්‍ය දෙවියො වැසි වස්සපු හින්දා අලි ඇතුන් පහළ පොකුණේ සතුටින් ක්‍රීඩා කරමින් ඉන්න හැටි එතන ගලේ නෙළලා තියෙන්නේ.

මේ මේඝ ගිරි විහාරෙ පිහිටා තිබුණෙ රජ්ජුරුවන්ගේ මඟුල් උයන ළඟ. ඒ උයනට කීවෙත් 'මහා මේඝ වන' කියලා. ඒකට සිංහලෙන් කීවෙ 'මහ මෙවුනා' කියලා. එහෙම නමක් දෙන්ට හේතුව ඒ උයන මිහිඳු මහ රහතන් වහන්සේට පූජා කරන දවසෙ මහා මේඝයක් ආ නිසා බවත් කියනවා.

(C) Sumitha Publishers


(C) Sumitha Publishers

පහළ කොටසේ ගලේ නෙළා ඇති අලි ඇත්තු


(C) Sumitha Publishers

ලෙන් විහාර ගේ



(C) Sumitha Publishers

ලෙන් විහාරගෙයි ඉඳි පිළිම වහන්සේ


(C) Sumitha Publishers

ලෙන් විහාර ගෙයි හිටි පිළිම වහන්සේ හා සිතුවම්


(C) Sumitha Publishers

බෝධීන් වහන්සේ